**සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා සමාගම - 2015/2016**

-----------------------------------------------------------------------------------

සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා සමාගමේ 2016 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ අලාභ හා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඇතුලත් 2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව, මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

---------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

-----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ව්‍යාචනය සඳහා පදනම**

-------------------------------------

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1 හි 10 ඡේදය ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සමාගම විසින් භාවිතා කරනු ලැබූ ගිණුම්කරණ මූලධර්ම හා ප්‍රතිපත්ති සහ එම ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුගමනය කිරීමේ සංගතතාවය පිළිබිඹු වේද යන්න පිළිබඳව හෙළිදරව්කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01 හි 32 ඡේදය ප්‍රකාරව ප්‍රමිතයක් මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් හිළව් නොකළ යුතු වුවත් 2016 මාර්තු 31 දිනට රු.18,118,028 ක්වූ ණයගැති බැර ශේෂ 13 ක් එදිනට පැවති ණයගැති හර ශේෂවලට හිලව්කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ආරම්භක විලම්භිත බදු වගකීම් ශේෂය රු.2,616,217 ක් අඩුවෙන් දක්වා තිබූ අතර සමාලෝචිත වර්ෂයේ ආදායම් බදු බැරකම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 12 අනුව අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂය සඳහා විලම්භිත බදු සඳහා වෙන් කිරීමද සිදුකර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 ට පටහැනිව ධාරණ අගය ශුන්‍ය වී තිබුණු වත්කම් අයිතම 4 ක් තවදුරටත් ක්ෂය කිරීම හේතුවෙන් වත්කම්වල පිරිවැය ඉක්මවා රු.1,624,380 ක් ක්ෂය ප්‍රතිපාදනය කර තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 හි 64 ඡේදය ප්‍රකාරව අස්ථිත්වයේ පශ්චාත් සේවක ප්‍රතිලාභ බැඳීම ගණනයේදී පුරෝකථනය කළ ඒකක බැර ක්‍රමය යොදා ගත යුතු වුවද ඊට පටහැනි

ලෙස නිලධාරියාගේ අවසන් වැටුප හා සේවා කාලය පමණක් පදනම් කරගෙන ගණනය කිරීම් සිදුකර තිබුණි. එසේ ගණනය කර විගණනය සඳහා ඉදිරිපත් කරන ලද උපලේඛන අනුව පාරිතෝෂික දීමනා වගකීම රු.53,143,463 ක් වුවත් එය මූල්‍ය ප්‍රකාශනවල රු.54,097,253 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.953,790 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඊ) ගනුදෙනුකරුවන්ගෙන් තැන්පත් මුදල් ලෙස සමාගමට ලැබී තිබුණු ඇ.ඩො.74,935ක් සමාලෝචිත වර්ෂය අවසාන දිනට රුපියල් අගයට පරිවර්තනය කිරීමේදී විගණනයේ ගණනය කිරීම් අනුව රු.1,458,107 ක් අඩුවෙන් දක්වා තිබුණි. තවද සමාලෝචිත වර්ෂය අවසාන දිනට ගනුදෙනුකරුවන්ගේ තැන්පත් ගිණුම්වල පැවති ශේෂය ඇමෙරිකන් එක්සත් ජනපද ඩොලර් අනුපාතය සමඟ ගැලපීමේදී රු.1,388,042 ක විනිමය අලාභයක් වුවද එය ගිණුම් වල ගලපා නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයට අදාලව නිලධාරීන්ගෙන් අඩුකරගෙන තිබූ රු.1,894,309 ක් වූ උපයන විට ගෙවීමේ බදු සමාගම විසින් ගෙවීම් කිරීමේදී සමාගමේ වියදමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. තවද, විගණනයේ ගණනය කිරීම් අනුව 2016 මාර්තු 31 දිනට ගෙවිය යුතු උපයන විට බදු ශේෂය රු.574,971 ක් වුවද එය මූල්‍ය ප්‍රකාශනවල රු.2,189,287 ක් ලෙස එනම් රු.1,614,316 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) 2015 අප්‍රේල් 01 දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී රු.2,470,047 කින් වැඩිපුර දක්වා තිබුණු අතර සමාගමේ ගොඩබිම් හා සමුද්‍ර ආරක්ෂණ අංශ විසින් ස්ථාවර තැන්පතු මත පොලී ආදායම ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ පොලී ආදායම රු.8,153,049කින් වැඩිපුර දක්වා තිබුණි.

(එ) සමාගමේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාලව පස් පරීක්ෂාව, උපදේශන සේවා හා සැලසුම් සකස් කිරීම වැනි ඉදිකිරීමේ පූර්ව කටයුතු සඳහා රු.739,461,677 ක පිරිවැයක් දරා තිබූ අතර 2015 ජූලි 03 දින සිට ඉදිකිරීම් කාර්යය අත්හැර දමා තිබුණි. කෙසේ වුවද මෙම පිරිවැය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වත්කම් යටතේ ගොඩනැගිලි ඉදිකිරීම් වැඩ ලෙස දක්වා තිබුණද එහි භෞතික පැවැත්මක් නොවීය.

(ඒ) ආදායම් බදු නොගෙවීම හේතුවෙන් ඉකුත් තක්සේරු වර්ෂ 04 කට අදාලව සමාගම විසින් දඩ මුදල් ලෙස එකතුව රු.408,162,229 ක් ගෙවිය යුතු බව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් දන්වා තිබුණද ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඔ) භෞතික තොග සත්‍යාපන වාර්තා අනුව සමාලෝචිත වර්ෂය අවසාන දිනට සමාගමේ පතරොම් තොගයේ වටිනාකම රු.38,128,032ක් වුවත් තොග ලේඛන අනුව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ වටිනාකම රු.26,438,889 ක් වූයෙන් රු11,689,143 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඕ) වෙළඳ ණයගැතියන් (දේශීය අංශය) යටතේ රාජ්‍ය ආයතන 3 කින් ලැබිය යුතු ලෙස රු.36,519,077 ක් දක්වා තිබුණද අදාල රාජ්‍ය ආයතනවල මූල්‍ය ප්‍රකාශන අනුව එම වටිනාකම රු.25,887,599 ක් වූයෙන් රු.10,631,478 ක වෙනසක් විය.

(ක) 2016 මාර්තු 31 දිනට ණයගැතියන් 12 දෙනෙකුගෙන් අයවිය යුතු රු.32,101,487 ක් හා ඇ.ඩො.22,335 ක්වූ ශේෂයන් අදාල ණයගැතියන් විසින් සනාථ කර තිබුණේ පිළිවෙලින් රු.13,047,135 ක් හා ඇ.ඩො.374 ක් වශයෙනි. ඒ අනුව ණයගැති ශේෂවල පිළිවෙලින් රු.19,054,352 ක හා ඇ.ඩො.21,961 ක වෙනසක් පැවතුණි.

(ග) මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 මාර්තු 31 දිනට සමුද්‍ර ආරක්ෂක අංශයේ වෙළඳ ණයගැති ශේෂ එකතුව රු.1,418,390,685 ක් වුවද විගණනය සඳහා ඉදිරිපත් කරන ලද විස්තරාත්මක උපලේඛන අනුව එය රු.1,398,444,298 ක් වීමෙන් රු.19,946,387 ක වෙනසක් පැවති අතර එම වෙනස සැසඳීමට කටයුතු කර නොතිබුණි.

(ට) 2016 මාර්තු 31 දිනට සමාගමේ රු.2,289,588,565 ක්වූ වෙළඳ ණයගැති හා වෙනත් ලැබිය යුතු ශේෂය තුල ඇතුලත් සීමාසහිත ඇවන්ට් ගාර්ඩ් මෙරිටයිම් සර්විසස් (පුද්ගලික) සමාගමෙන් ලැබිය යුතු රු.1,770,603,355 ක ශේෂය සහ මූල්‍ය ප්‍රකාශනවල එම සමාගමට ගෙවිය යුතු ලෙස දක්වා තිබුණු රු.762,731,509 ක ශේෂය එම සමාගම විසින් සනාථ කර නොතිබුණි. තවද, ඇවන්ට් ගාර්ඩ් සමාගම විසින් රක්නා ආරක්ෂක ලංකා සමාගමට එරෙහිව සිංගප්පූරු අධිකරණයක පවරා තිබුණු බේරුම්කාර නඩුවක තීන්දුව ලෙස ඇ.ඩො.5,000,000 ක් හා සිංගප්පූර් ඩොලර් 826,000 ක් ඇවන්ට් ගාර්ඩ් මෙරිටයිම් සර්විසස් (පුද්ගලික ) සමාගම වෙත ගෙවීමට නියම කර තිබුණද ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමක් හෝ වෙන් කිරීමක් සිදුකර නොතිබුණි.

(ඩ) සමාගම විසින් වැරදි නිවැරදි කිරීම සඳහා ලෙජර් ගිණුම්වල සමාලෝචිත වර්ෂයේදී රු.34,536,430 ක ගැලපීම් සිදුකර තිබුණු නමුත් ජර්නල් සටහන් සහ එම ගැලපීම් බලයලත් නිලධාරීන් විසින් අනුමත කර නොතිබීම හේතුවෙන් එම ගැලපීම් විගණනයේදී පිළිගැනීමට නොහැකි විය.

(ත) සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු පාලන ගිණුමක පැවති රු.4,575,458 ක්වූ (හර) ශේෂ සහ වෙනත් පාලන ගිණුම් 02 ක පැවති රු.90,882,492 ක්වූ (බැර) ශේෂ සම්බන්ධ උපලේඛන විගණනයට ඉදිරිපත් නොවීය.

(ත) සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල කෙටිකාලීන තැන්පතු යටතේ දක්වා තිබූ රු.115,818,757 ක ස්ථාවර තැන්පතුව හා මූල්‍ය කල්බදු වගකීම යටතේ දක්වා තිබූ රු.2,261,874 ක්වූ බැරකම සඳහා සෘජු ශේෂ සනාථන ලබාගෙන නොතිබුණි.

(ද) සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු තැන්පතුවල ඇතුළත් රු.96,775,692 ක්වූ පාරිභෝගික තැන්පතු පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.

**2. මූල්‍ය ප්‍රකාශන**

-----------------

**2.1 මතය ව්‍යාචනය**

-------------------

මෙම වාර්තාවේ 1.4 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොටගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**2.1.1 වෙනත් කරුණු**

-------------------

සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා සමාගමේ 2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන පෞද්ගලික විගණන සමාගමක් විසින් විගණනය කර තිබුණු අතර තත්ත්වාගණනය කරන ලද මතයක් සහිතව විගණන වාර්තාව 2016 මැයි 16 වන දින නිකුත් කර තිබුණි.

**2.1.2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය ප්‍රකාරව මා විසින් පහත සඳහන් කරුණු දක්වමි.

(අ) මතය ව්‍යාවනය සඳහා පදනම හා විගණනයේ විෂය පථය සහ සීමා කිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) මෙම වාර්තාවේ මතය ව්‍යාවනය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති වැදගත් සීමා කිරීම්වලට යටත්ව,

- විගණනය සඳහා අවශ්‍ය තොරතුරු හා පැහැදිලි කිරීම් ප්‍රමාණවත් ලෙස ලැබුණු බවත් මාගේ පරීක්ෂණවලින් පෙනී යන අන්දමට සමාගම විසින් ප්‍රමාණවත් පොත්පත් හා වාර්තා පවත්වා නොමැති බවත්,

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියේ දැක්වෙන අවශ්‍යතාවන් හා අනුකූල බවත් මා දරන්නා වූ මතය වේ.

**2.2 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

---

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) 2007 අංක 07 දරන සමාගම් පනත | |
| (i) 131 වගන්තිය | වාර්ෂික මහා සභා රැස්වීම පවත්වා වැඩ කරන දින 30 ක් ඇතුළත සමාගමේ වාර්ෂික වාර්තාවේ පිටපතක් සමාගම් රෙජිස්ටාර්වරයා වෙත යැවිය යුතු වුවත්, 2014/2015 වර්ෂ සඳහා වූ වාර්ෂික වාර්තාව යවා නොතිබුණි. |
| (ii) 150 (1) වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 සැප්තැම්බර් 30 දිනට පෙර විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවත්, එම මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කරන ලද්දේ 2017 ජූලි 12 දින දීය. |
| (iii) 184 (අ) වගන්තිය | සමාගමේ සියළුම ව්‍යාපාරික හා අනෙකුත් කටයුතු අධ්‍යක්ෂ මණ්ඩලයේ මඟපෙන්වීම හා අධීක්ෂණය යටතේ සිදු විය යුතු වුවත්, 2015 ජනවාරි 28 දින සිට අප්‍රේල් 07 දින දක්වා මාස 02ක පමණ කාලයක් සමාගම අධ්‍යක්ෂක මණ්ඩලයකින් තොරව කටයුතු කර තිබුණි. |
| (iv) 223 (2) වගන්තිය | සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සිදු වී ඇති වෙනස්කම්වලට අදාල ලේඛණ, සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 751 | වටිනාකම රු.32,875,204 ක්වූ තොග සම්බන්ධයෙන් තොග ලේඛන පවත්වා නොතිබුණි. |
| (ඇ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පිරිවැය රු.146,632,843 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ඈ) | 2006 අංක 10 දරන දේශීය ආදායම් බදු පනතේ 26 වන වගන්තිය (1) L | බදු අය වන ලාභය ගණනය කිරීමේදී රු.33,793,700 ක්වූ ජාතිය ගොඩනැගීමේ බදු වියදම ලාභයට එකතුකර දක්වා තිබුණු බැවින් බදු වගකීම රු.9,462,236 ක් වැඩියෙන් දැක්වුණි. |

**2.3 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සමාගම විසින් ලංකා බැංකුවේ හා මහජන බැංකුවේ ස්ථාවර තැන්පතු වශයෙන් රු.535,681,123ක් හා ඇමරිකානු ඩොලර් 1,000,000 ක මුදලක් ආයෝජනය කර තිබුණු අතර භාණ්ඩාගාර බිල්පත්වල රු.20,607,193 ක් ආයෝජනය කර තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව , සමාලෝචිත වර්ෂයේදී සමාගමේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.356,674,678 ක ලාභයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු.727,118,969 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.370,444,291 ක පිරිහීමක් නිරීක්ෂණය විය. රාජ්‍ය ප්‍රතිපත්තිවල හා කළමනාකරණ මණ්ඩලයේ වෙනස් වීම මත සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ආදායම රු.779,578,114 කින් අඩුවී තිබීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

**4.1.1 සැලසුම් කිරීම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය**

---------------------------------------

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 2 ක සමාගමේ මෙහෙයුම් කටයුතු පිළිබඳ විශ්ලේෂණයක් පහත දැක්වේ.

| විස්තරය | 2015/ 2016 | 2014/ 2015 | 2013/ 2014 |
|---|---|---|---|
| (අ) මෙහෙයුම් ආදායම | | | |
| සමුද්‍ර ආරක්ෂක මෙහෙයුම් (රු.) | 807,661,049 | 1,450,210,877 | 1,817,787,672 |
| ගොඩබිම් ආරක්ෂක මෙහෙයුම් (රු.) | 996,584,466 | 1,133,612,752 | 1,120,557,361 |
| (ආ) අනුයුක්ත කර තිබුණු ආරක්ෂණ නිලධාරීන් | | | |
| සමුද්‍ර ආරක්ෂක මෙහෙයුම් (සංඛ්‍යාව) | 835 | 825 | 695 |
| ගොඩබිම් ආරක්ෂක මෙහෙයුම්(සංඛ්‍යාව) | 2143 | 2736 | 2684 |
| (ඇ) ගොඩබිම් ආරක්ෂක මෙහෙයුම් සේවාවන් ලබා ගැනීමෙන් ඉවත් වූ ආයතන සංඛ්‍යාව | 19 | 22 | 04 |

උක්ත සංඛ්‍යාලේඛන අනුව සමාගමේ සමුද්‍ර ආරක්ෂක මෙහෙයුම් ආදායම හා ගොඩබිම ආරක්ෂක මෙහෙයුම් ආදායම 2013/2014 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් රු.1,010,126,623 කින් හා රු.123,972,895 කින් අඩුවී තිබුණි.

2015 වර්ෂයෙන් පසුව රාජ්‍ය ආයතන ආරක්ෂක සේවා ලබා ගැනීම සඳහා තරඟකාරීත්වයකට භාජනය කර තිබූ අතර සමාගම විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් අනෙකුත් ආයතනවලට වඩා වැඩිවීම හේතුවෙන් රාජ්‍ය අංශයේ ආරක්ෂක සේවා සැපයීමේ වෙළඳපල කොටස සමාගමට අහිමිවී තිබීම සමාගමේ මෙහෙයුම් ආදායම අඩුවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

කෙසේ වුවද, රාජ්‍ය ප්‍රතිපත්ති වෙනස්වීම හේතුවෙන් සමාගමේ ප්‍රධාන ව්‍යාපාරික අවස්ථාවන් අහිමි වීමේ අවදානමක් පවතින බව විගණනයේදී නිරීක්ෂණය වූ අතර නව ව්‍යාපාරික අවස්ථාවන් විශ්ලේෂණය කර අනාගත අවදානම් අවම කිරීම සඳහා ප්‍රමාණවත් වැඩපිළිවෙලක් සමාගම විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.

**4.2 විග්‍රහාත්මක සමාලෝචනය**

-------------------------------

| | 2015/ 2016 | 2014/ 2015 | වැඩිවීම / (අඩුවීම) |
|---|---|---|---|
| (අ) දළ ලාභ අනුපාතය(%) | 29.01 | 38.08 | (9.07) |
| (ආ) ශුද්ධ ලාභ අනුපාතය(%) | 26.44 | 35.75 | (9.31) |
| (ඇ) කොටසක ඉපයුම් අනුපාතය | 713.06 | 1,453.64 | (51)(සියයට) |

ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාගමේ දළ ලාභ අනුපාතය, ශුද්ධ ලාභ අනුපාතය, කොටසක ඉපයුම් අනුපාතය පිළිවෙලින් සියයට 9, සියයට 9 හා, සියයට 51 කින් අඩුවී තිබුණි.

**4.3 කළමනාකරණ ක්‍රියාකාරකම්**

සමාගමේ සාංගමික සංස්ථා පත්‍රයේ අරමුණු යටතේ දක්වා තිබූ අරමුණුවලට අනුකූල නොවන ලෙස සමාගම විසින් බාහිර පාර්ශවයන් සඳහා භෝජනාගාර සේවයක් ක්‍රියාත්මක කර තිබුණි.

**4.4 කාර්යමණ්ඩල පරිපාලනය**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 ප්‍රකාරව, සමාගම විසින් සංවිධාන සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර 9.3 ඡේදය ප්‍රකාරව සේවකයන්ගේ වැටුප් තල, බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව ක්‍රියාත්මක කර තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 අභ්‍යන්තර විගණනය**

සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**5.2 විගණන කමිටු**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කර නොතිබුණි.

**5.3 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 4.2 ඡේදය ප්‍රකාරව සමාගම විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර ඒ හේතුවෙන් භාණ්ඩ මිලදී ගැනීමේ අවශ්‍යතාවය, ඒවා ලබාගත යුතු කාලය, ලබාගත හැකි ආකාරය සම්බන්ධයෙන් නිසි සැලසුමක් නොවීය.

**5.4 අයවැය ලේඛනමය පාලනය**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.7 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සමාගමේ සභාපතිවරයා වෙත යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) මූල්‍ය පාලනය | වාර්ෂික අයවැය, ප්‍රසම්පාදන සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල නොකිරීම සහ ආයෝජන සඳහා අනුමැතිය ලබා නොගැනීම. |
| (ආ) ගිණුම්කරණය | ඇතැම් ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු නොකිරීම සහ මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදු නොකිරීම, ගණුදෙනු නිවැරදිව ගිණුම්ගත නොකිරීම. |
| (ඇ) බදුකරණය | ගෙවිය යුතු බදු නිවැරදිව ගණනය නොකිරීම හා නියමිත දිනට ගෙවීම් නොකිරීම. |
| (ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය | සේවකයින් බඳවා ගැනීමේ පටිපාටිය සහ උසස් කිරීමේ පටිපාටිය සඳහා අනුමැතිය ලබා නොගැනීම. |